කොස් /දෙල් ගස් හෙලීම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

1) හෙලීම් බලපත්‍රයක් ඉල්ලුම් කිරීමේ අයදුම්පත

2) ගස හෙලීමේ අවශ්‍යතාවය ඇතුලත් ඉල්ලීම් ලිපිය (ග්‍රාම නිලධාරි මඟින් නිර්දේශ කරන ලද)

3) ගස පිහිටි ඉඩමේ ඔප්පුවේ පිටපතක් (ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද)

4) ගස පිහිටි ඉඩමේ සැලැස්මෙහි පිටපතක් (ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද)

- නොබෙදූ ඉඩමක් නම්, ප්‍රාණ භූක්තියට යටත්ව අයිතිය හිමිවේ නම්, අනෙක් සියලුම පාර්ශවකරුවන්ගෙන් ගස හෙලීමට කැමැත්ත ප්‍රකාශිත ලිපි (ප්‍රකාශ කර පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද) ඉදිරිපත් කළ යුතුය.

- ඉඩමේ හිමිකරු මිය ගොස් ඇත්නම්, ඉල්ලුම්කරුට ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා අදාල ලේඛනයන්හි සහතික කරන ලද පිටපත් (උදා. උප්පැන්න සහතික, විවාහ සහතික, මරණ සහතික ...) ඉදිරිපත් කළ යුතුය.

- ලේඛන වල සඳහන් නම් වල පරස්පරතාවයක් ඇත්නම් නිවැරදි නම සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

- ඉඩමේ හිමිකරුට හෝ ඔහුගේ / ඇයගේ දරුවකුට නිවසක් ඉදිකිරීමේ දී අවශ්‍ය දැව සපයා ගැනීම සඳහා ගසක් හෙලීමට නම්, අදාල අධිකාරිය විසින් අනුමත කළ ඉදිකිරීම් සැලැස්මෙහි සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- එසේම නිවස ඉදිකරන බවට අදාල ග්‍රාම නිලධාරී විසින් නිර්දේශ කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය (නිවස ඉදි කරනුයේ මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටත ප්‍රදේශයක නම් එම ලිපිය අදාල කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර ඉදිරිපත් කළ යුතුය.)

- ගොඩනැගිල්ලක ඉදිකිරීමේදී, ඉදිකිරීම් කාර්යයට බාධාවක්ව පවතින ගසක් හෙලීමට නම්, අදාල අධිකාරිය විසින් අනුමත කළ ඉදිකිරීම් සැලැස්මෙහි සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- නොබෙදූ ඔප්පුවකින් ලද නමුත් තමන්ට හිමි ඉඩම් කොටස වැට මායිම් යොදා නිරවුල්ව දීර්ඝ කාලයක් භුක්ති විඳින අවස්ථාවක දී.
ඔප්පුවක් නොමැති වුවද එකී ඉඩම් කොටස වැට මායිම් යොදා නිරවුල්ව දීර්ඝ කාලයක් භුක්ති විඳින අවස්ථාවක දී,

දීර්ඝ කාලයක් ඉඩම් භුක්ති විඳ ඇති බවටත් වෙනත් හවුල් කරුවන් නොමැති බවටත්. ගසෙහි/ ගස් වල අයිතිය සම්බන්ධයෙන් වෙනත් පාර්ශවයකින් ගැටළුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් තමා වගකීම භාර ගන්නා බවටත්, කිසියම් හේතුවක් මත ගසෙහි/ගස්හි වටිනාකමට තක්සේරුගත මුදල අධිකරණය වෙත ගෙවීමට සිදු වුවහොත් එයට එකඟ වන බවත් තහවුරු කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

බලපත්‍ර අංක : E10/2/2026 /

1951 අංක 09 දරණ ගස් හෙළීම් ආඥා පනත යටතේ කොස් / දෙල් / තල් / පොල් ගස් කපා හෙළීමේ අයදුම්පත

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාලිම්බඩ

1. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම -.....
   (ii) ලිපිනය - .....
   (iii) දුරකථන අංකය - .....
   (iv) ජාතික හැඳුනුම්පත් අංකය - .....

2. (i) කැපීමට ඉල්ලුම් කරන ගස් වර්ගය -.....
   (ii) ගස් ප්‍රමාණය - .....
   (iii) ගස් කැපීම සඳහා ඉල්ලීමට හේතු - .....

3. (i) ග්‍රාම නිලධාරී වසම - .....

4. ඉඩමේ අයිතිය : ප්‍රවේණි / ජයභූමි / ස්වර්ණභූමි / බලපත්‍ර ඉඩම් / සින්නක්කර / වෙනත්
5. ඉඩමේ නම - .....
6. (i) ඔප්පු අංකය : ..... (ii) කැබලි අංකය :.....
   (ග්‍රාම නිලධාරීන් විසින් සහතික කරන ලද ඔප්පු පිටපතක් මේ සමඟ ඉදිරිපත් කල යුතුය.)
7.

ඉඩමේ හතර මායිම්	
උතුර	
නැගෙනහිර	
දකුණ	
බටහිර	

8. (i) ප්‍රවාහනයට අවශ්‍යද? ඔව් / නැත

   (ii) අවශ්‍ය නම් ස්ථානය : .....

9. ඉඩමට යන ගමන් මඟ -

   .....
   .....

   දිනය 202 / /

   .....
   අයදුම්කරුගේ අත්සන

ග්‍රාම නිලධාරී වාර්තාව

10. .....අංක දරණ ඔප්පුව / බලපත්‍රය පරීක්ෂා කරන ලදි. අංක 01 සිට 09 දක්වා ඉල්ලුම්කරු සඳහන් කරන ලද කරුණු සියල්ල නිවැරදියි. / වැරදි නිවැරදි කළා. දැව හෙළීමට අදාලව නිකුත් කර ඇති චක්‍රලේඛ සහ උපදෙස් වලට අනුව ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන අයදුම්පතට අමුණා ඇත.

11. ගස පරීක්ෂා කළ දිනය 202 / /
12. ගස් ඉල්ලුම් කරන ඉඩමේ පිහිටා ඇත්ද? ඇත / නැත
13. ඉඩම බෙදූ / නොබෙදූ ඉඩමක්ද? .....
14. ආරවුලකට තුඩු දෙන මායිමක පිහිටා ඇත්ද? - ඇත / නැත / ආරවුල් නිරවුල් කර ඇත
15. (i) ඉඩමේ රක්ෂිත තිබේද? ඇත / නැත / සැලැස්ම ඉදිරිපත් කර ඇත.
    (ii) රක්ෂිත තිබේ නම් රක්ෂිතයේ සිට දුර සහ ඒ පිළිබඳ විස්තර -

    .....
    .....
    .....

16. හෙලීමට අයදුම්කර ඇති ගස් පිළිබඳ විස්තර

ගස් වර්ගය	වට ප්‍රමාණය (මීටර් / මිලි මීටර්)	උස (මීටර්)
1.		
2.		
3.		

17. (i) ප්‍රවාහනයට අපේක්ෂිතද? ඔව් / නැත (ii) ප්‍රවාහනයට අතු තිබේද? ඔව් / නැත

18. පහත මායිම් තුළ පිහිටි ඉඩමේ ගස පිහිටා ඇත

උතුරට ..... දකුණට .....
නැගෙනහිරට ..... බස්නාහිරට .....

19. ඉඩම තුළ ගස / ගස් හා නිවාස පිහිටීම *(දුර සටහන් කරන්න)*

20. ගස / ගස් කපා ඉවත් කිරීමට හේතුව .....
(i) ජීවිත / නිවාස හෝ ගොඩනැගිලි වලට අනතුරුදායක
(ii) විදුලි රැහැන් වලට අනතුරුදායක
(iii) නිවාස ඉදිකිරීම සඳහා
(iv) ඵල නොදරන / මිය ගිය ගස්
(v) වෙනත් (හේතුව සඳහන් කරන්න) .....

21. සිටුවන ලද ගස් වර්ගය හා ප්‍රමාණය .....

ඉහත සඳහන් ගස / ගස් මා විසින් පරීක්ෂා කළ බවත් අංක 10 සිට 21 දක්වා මවිසින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් සහතික කරමි. ඉහත අංක 20 සඳහන් හේතුව මත ඉල්ලුම් කර ඇති ..... ගස / ගස් ..... පමණක් කපා ඉවත් කිරීමට නිර්දේශ කරමි. / නිර්දේශ නොකරමි.

දිනය - .....

.....
ග්‍රාම නිලධාරී අත්සන හා නිල මුද්‍රාව

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.</u>

නිර්දේශය - (ස්වදේශ කටයුතු චක්‍රලේඛ 03/2022 අනුව හෙලීමට ඉල්ලුම් කර ඇති ගස් වෙනුවෙන් සිටුවා ඇති බවට ග්‍රා.නි.විසින් සඳහන් කර ඇති ගස් පිළිබඳ ඔබගේ නිරීක්ෂණ ද සටහන් කරන්න.)

.....
.....
.....
.....පරීක්ෂා කළා ..... දින

.....
ස.ප්‍රා.ලේ. / පරි.ග්‍රා.නි. / ක්ෂේත්‍ර නිලධාරී

<u>ප්‍රාදේශීය ලේකම් අනුමැතිය</u>

ඉහත නිර්දේශය පරිදි අංක 16 හි සඳහන් ..... ගස / ගස් ..... හෙලීමට බලපත්‍ර ලබා දීම අනුමත කරමි. / නොකරමි.

දිනය 202 / /

.....
ප්‍රාදේශීය ලේකම්, මාලිම්බඩ